

# පරිසර සැරිසර

ශ්‍රී ලංකාවේ පළවන එකම පාරිසරික සංචාරක පුවත් පත

වෙළුම 2 - 2009, ජනවාරි
ISBN 1291-6977
ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනමේ ප්‍රකාශනයකි




# පාරිසරික සංචාරක කලාපීය සමුළුවක් ශ්‍රී ලංකාවේ

## Asia-Pacific Regional Ecotourism Conference 2009 (APREC 2009)

1998 දී ආරම්භකරන ලද ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනමට (Sri Lanka Ecotourism Foundation) එකොළොස් වසරක් සපිරීම් වස් ආසියා හා ශාන්තිකර කලාපීය පාරිසරික සංචාරක සමුළුවක් 2009 මැයි මස ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම, ශ්‍රී ලංකාවේ පුරෝගාමී හා ජාතික, පාරිසරික සංචාරක සංගමය ලෙස පාරිසරික සංචරණය (Ecotourism) ජාතික, කලාපීය හා ජාත්‍යන්තර තලයකට ගෙනඒම සඳහා පසුගිය කාලය තුළ සුවිශේෂී මෙහෙවරක් ඉටුකොට ඇත.



ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ඉදිරි ගමන සඳහා නව මංමාවත් හෙළි පෙහෙළි කළ ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනමේ මූලික අරමුණු වන්නේ

- සොබාදහමේ අපූර්වතම වූ සොඳුරු දසුන් මැවීමට මහෝපකාරී වන්නාවූ පරිසරය හා සොබාවික සම්පත් රැකගැනීම
- එම සත් කාර්‍යය සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම
- ස්වභාවික සම්පත් ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් තුළින් සංචාරක ව්‍යාපාරය ජනනය කරන්නාවූ ආර්ථික වාසි ජනතාවගේ ශුභ සාධනය හා දිළිඳු බව පිටු දැකීම සඳහා යොදා ගැනීම
- චිරාත් කාලයක් මුළුල්ලේ රටක පෝෂණය වූ සංස්කෘතිකමය දායාදයන් හා සමාජ සංස්කෘතික සාරධර්මතාවන්ට ගරු කිරීමට රටක ජනතාව පෙලගැස්සවීම
- ඉහතින් සඳහන් කරන ලද පාරිසරික හා ජනතා හිතකාමී සංචාරක ව්‍යාපාරය හා බැඳුනු මූලධර්ම හා සංචාරක ගමනාන්තයක හමුවන්නාවූ පරිසර පද්ධති, ජනතා පැතුම්, සංස්කෘතික උරුමයන් පිළිබඳව දේශීය හා විදේශීය සංචාරකයන් දැනුවත් කිරීම

2009 මැයි මස ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන ආසියා ශාන්තිකර කලාපීය පාරිසරික සංචාරක සමුළුවේ (Asia-pacific Regional Ecotourism Conference) මූලික තේමාව වන්නේ :




ආසියා-ශාක්තිකර කලාපයේ ක්‍රියාත්මක වන්නාවූ ප්‍රජාමූල පාරිසරික සංචාරක වැඩසටහන් (Ecotourism Programs of Asia - Pacific Region) පිළිබඳව සංචාරකයන් දැණුවත් කිරීම

- ඒ සඳහා කලාපීය මට්ටමෙන් අලෙවි ප්‍රවර්ධන (Marketing strategies) කටයුතු සංවිධානය කිරීමත් එමගින් ප්‍රජාමූල පාරිසරික සංචාරක පැකේජයන් මිලදී ගැනීම සඳහා සංචාරකයන් උනන්දු කරවීමත් වේ.
- ඉහත කී කරුණු සපුරාගැනීම සඳහා ආසියා ශාන්තිකර කලාපයේ ක්‍රියාකාරී පාරිසරික සංචාරක සංගම් නියෝජනය වන ආකාරයෙන් ශක්තිමත් පාරිසරික සංචාරක කලාපීය ජාලයක් (Ecotourism Network) පිහිටුවීම

ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනමේ මූලිකත්වයෙන් සංවිධානය කෙරෙන මෙම කලාපීය සමුළුව සාර්ථක කරගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ සංගමය (Sri Lanka Convention Bureau)තම සහයෝගය පළ කොට ඇත.

ජාත්‍යාන්තර මට්ටමෙන්, ජාත්‍යාන්තර පාරිසරික සංචාරක සංගමය (The International Ecotourism Society -TIES)ඇතුළු ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන රැසක් ද ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම වෙත තම ක්‍රියා කාරී සහයෝගීතාව පළ කොට ඇත.

වැඩි විස්තරසඳහා www.aprec2009.com වෙබ් අඩවිය බලන්න. sleco@sltnet.lk ඊමේල් පණිවිඩයක් එවීමෙන්ද විස්තර ලබා ගත හැක.

# පරිසර සැරිසර

## පාරිසරික හා ජනතා හිතකාමී සංචාරක ව්‍යාපාරය

### මූලික අරමුණු

සොබාදහමේ අපූර්වතමවූ සුන්දර දසුන් මැවීමට මහෝපකාරී වන්නාවූ පරිසරය හා ස්වාභාවික සම්පත් රැක ගැනීමටත්, එම සත් කාර්යය සඳහා ජනතා සහභාගීත්වය ලබාගැනීමටත්, ස්වභාවික සම්පත් ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් තුළින් ජනනය කරන්නාවූ ආර්ථික වාසි ජනතාවට ලබාදෙන්නාවූත් අරමුණු මුල්කරගත් පාරිසරික හා ජනතා හිතකාමී සංචාරක ව්‍යාපාරය නූතන සංචාරක ව්‍යාපාරය තුළ ඉමහත් අවධානයට ලක්වී ඇති මාතෘකාවකි.




පාරිසරික සංචාරක ක්‍රියාවලින් ජනනය කරන්නාවූ ආදායම, රටක ජනතාවගේ දුගී දුප්පත්කම, විරැකියාව දුරලීමටත්, දේශයක් තුළ චිරාත්කාලයක් මුළුල්ලේ පෝෂණය වන්නාවූ සංස්කෘතික දායාදයන් හා සමාජ සංස්කෘතික සාරධර්ම රටාවන්ට ගරු කිරීමට රටක ජනතාව පෙළගැස්සවීමත්, සංචාරකයින් දැනුවත් කිරීමත්, පාරිසරික හා ජනහිතකාමී සංචාරක ව්‍යාපාරයේ අනිත් මූලික අරමුණු වෙත්.

පාරිසරික හා ජනතා හිතකාමී සංචාරක ව්‍යාපාරය කේන්ද්‍රස්ථව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනයට උරදීම හා එමගින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සාමාජික හා සංස්කෘතිකමය පදනම ශක්තිමත් කිරීමත්, රට රැකුලක් ලෙස ජනතා සහභාගීත්වයෙන් ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යවසාය සංගම් පිහිටුවීමට ජනතාව උනන්දු කිරීමත්, එමගින් සමස්ත ජනතාව ගේම දුගී දුප්පත්කම තුරන්කිරීමට දායක වීමත් ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිත කාමී සංචාරක පදනමේ අරමුණු වෙත්.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පසුගිය කාලය තුළදී ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම පහත සඳහන් කාර්‍යයන් හා සේවාවන් ක්‍රියාත්මක කරණ ලදී.

- ජාතික පාරිසරික සංචාරක ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශයට සහාය දීම.
- පාරිසරික සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීමේදී හා පවත්වාගෙන යාමේදී රට මගපෙන්වීම සඳහා අවශ්‍ය කරන නීති රීති සම්පාදනය පිළිබඳව පාර්ශව කරුවන් දැණුවත් කිරීම
- පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා සුදුසු කලාප හඳුනා ගැනීම
- පාරිසරික සංචාරක කර්මාන්තය කලාප වශයෙන් දියුණු කිරීමේදී ප්‍රජාමූල සංවිධානවල සහයෝගය උපරිම වශයෙන් ලබා ගැනීම




- පාරිසරික සංචාරක ව්‍යාපාරයෙන් ජනනය කරන්නාවූ ආදායමින් වැඩි කොටසක් එම සංචාර කලාප තුළ වෙසෙන පොදු මහජනතාවගේ ආර්ථික හා සමාජික අභිවෘද්ධිය සඳහා යෙදවීමට පියවර ගැනීමට බලධාරීන් උනන්දු කරවීම
- ජනතාවගේ සංස්කෘතික, සාමාජයීය හා ආගමික සිතුම් පැතුම් වලට හානි නොවන අයුරින් ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය කිරීමට අවශ්‍ය උපදෙස් හා දැණුම ලබා දීම
- දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන, බටහිර යුරෝපයේ බහු ජාතික සංචාරක සමාගම්වලට සම්බන්ධ ශ්‍රී ලංකාවේ මහා පරිමාණ සංචාරක ඒජන්ත සමාගම්වලට අමතරව, ශ්‍රී ලංකාවටත්, එහි ජනතාවටත්, පරිසරයටත්, සංස්කෘතිකමය පදනමටත් ආදරය කරන, එය රැකබලා ගැනීමට හැකි, ශ්‍රී ලංකාවට පැමිණෙන පාරිසරික සංචාරකයින්ට තෘප්තිමත් විය හැකි සංචාරක සේවාවන් සැපයිය හැකි, කුඩා හා සුලු පරිමාණ දේශීය සංචාරක ඒජන්ත ජාලයක් පිහිටුවීම හා ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා මූල්‍යමය, ද්‍රව්‍යමය හා වෙනත් ආකාරයෙන් රාජ්‍ය අනුග්‍රහය ලබා දීමට සංචාරක බලධාරීන් දැණුවත් කිරීම
- සංචාරක ව්‍යාපාරය දැනට දියණුව පවතින මුහුදුබඩ ප්‍රදේශ, සංස්කෘතික ත්‍රිකෝණය, නුවරඑළිය, මහනුවර, ජාතික වනෝද්‍යාන හා අභය භූමි ආශ්‍රිතව ජනතා සහභාගීත්වයෙන් නව ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යවසාය සංගම් පිහිටුවීම




- ඉහතින් සඳහන් කරනු ලැබූ සුළු පරිමාණ දේශීය සංචාර ඒජන්ත සමාගම්වල ආධාරය ඇතුව, පාරිසරික සංචාරක කලාපවල සියළුම පාරිසරික සංචාරක කටයුතු මෙහෙයවීමේ බලය පාරිසරික සංචාරක ප්‍රජා සංවිධානවලට පැවරීම හා එම කටයුතුවලට අඩු පොළියට හෝ සහනාධාර ක්‍රමයට මූල්‍ය ආධාර සැපයීමට රජය උනන්දු කරවීම
- පාරිසරික සංචාරක ව්‍යාපාරය දේශීය හා විදේශීය සංචාරකයින් අතර ජනප්‍රිය කරවීම සඳහාත්, ඒ ඒ පාරිසරික සංචාරක කලාප ආශ්‍රිත පරිසරය ආරක්ෂා කරගැනීම සඳහාත්, පාරිසරික සංචාරක ක්‍රියා වලින් ප්‍රවර්ධනය කිරීම සඳහාත් ඉහතකී ප්‍රජා සංවිධානවලට අවශ්‍ය පහසුකම් සලසාදීම.

## Sri Lanka Ecotourism Foundation (SLEF) celebrates its 11t anniversary in 2009.

For more information please visit our
web sites; www.ecotourismsrilanka.net
www.ecotourssrilanka.com

Sri Lanka Ecotourism Foundation (SLEF), established in 1998, is the pioneer National Ecotourism Organization in Sri Lanka, provides support services for local communities to participate in Community Based Ecotourism Enterprises (CBEs). The primary focus of SLEF is the sociocultural and socioeconomic development of rural communities in Sri Lanka through CBE operations. From its inception, SLEF has dedicated in promotion of ecotourism as a tool for poverty alleviation and sustainable community development in Sri Lanka.

During past 11 years SLEF has been committed to;
• Assure economic benefits to uplift the living standards of the rural communities in Sri Lanka through ecotourism. • SLEF encourages private and public sector participation in developing ecotourism business ventures which incorporates community benefits.
• Preserving of age-old cultural heritage and values of Sri Lanka society through the development of ecotourism. • Conserving the environment and biodiversity hotspots in Sri Lanka through best practices of ecotourism. • Disseminating information, conduct research, training and academic programmes on sustainable development and ecotourism to the visiting tourists and the general public of Sri Lanka.

### Ecotourism and Community Camping in Sri Lanka

poor communities often see ecotourism as one of the few livelihoods open for them. Communities, whose members are living in poverty, invariably find their young people migrate to urban centers because of the decline in traditional industries such as agriculture and fishing. Ecotourism can prevent this urban drift and provide an essential alternative income"

The SLEF is of the view that Community Camping is an ideal tool to provide economic benefits to the communities living around the tourism generating areas and places with scenic beauty and natural attractions of Sri Lanka. As mentioned above, Ecotourism should use as a tool to alleviate poverty in the tourism generating areas. SLEF is of the view; ecotourism should assure economic justification to the community living around the nature, wildlife and adventure sites through ecotourism activities. Then the community will in turn support in preserving and developing social and cultural values of the area through ecotourism. Ecotourism should make them aware and motivate the community in the area to preserve the natural resources and the biodiversity in appreciation of the economic returns the community receive through ecotourism operations. Because, poor communities often see ecotourism as one of the few livelihoods open to them. Communities, whose members are living in poverty, invariably find their young people migrate to urban centers because of the decline in traditional industries such as agriculture and fishing. Ecotourism can prevent this urban drift and provide an essential alternative income. In this exercise, Community Based Ecotourism Enterprises (CBEs) play the most important role within any ecotourism product or an experience. The concept of Community Based Ecotourism brings valuable meaning to the principles of ecotourism, without which the term itself can just be a buzzword. The true meaning of ecotourism can be found if it only incorporates the concepts of Community Based Ecotourism in to the product. Community Based Ecotourism Enterprises (CBEs) are the base to develop genuine ecotourism fabric in a country.

### COMMUNITY CAMPING

is possible in anywhere in Sri Lanka, anytime, without a much hassles such as big investments and infrastructure. During last few years, the SLEF was promoting Community Camping in many parts of tourism generating areas in Sri Lanka. The SLEF first introduced Community Camping at Kiralakelle Wetlands, Matara as far back as in 2003. Then in Ranpathwila, off Galgamuwa, Arugambay in the Eastern Province and the latest in Bundala National Park area in Hambantota District. More new Community Camping sites are to be started very soon. The uniqueness of these programme are, all these Community Camping programs are operated by the Community Based Ecotourism Enterprises (CBEs) in the rural villages, thus assuring total income for the community groups. In conventional or luxury camping operated by mainstream tourism operators in and around of national parks or cultural areas, the community gets very little income only as 'Labourers' . Under the Community Camping, communities are the 'Owners' of the camping business. Community Camping is the only alternative to encourage the ecotourists to stay overnight or longer in the natural areas as they could experience a genuine ecotourism experience interacting with the communities.

### Model Community Camping Programme at Bundala; the newest initiative

Recently, the SLEF in association with CARE International, Hambatota, initiated a very successful Community Camping Programme at Bundala National Park area, Hambantota. These sort of Community Camping programmes could be initiated and replicated in all tourism generating areas in Sri Lanka, including National Parks, Protected areas, Rainforests, Beaches, Cultural sites, Hill country or any area that presents natural beauty and scenic attractions. The Bundala Community Camping site is fully owned and operated by a group of youth from the area under the guidance of the Community Leaders of Bundala Village and the National Park officials.

### Aims and Objectives of the Community Camping Programme at Bundala

• Assure socioeconomic benefits to the communities living around the Bundala National Park and open up more avenues for Income Generating Activities (IGA) to the Bundala Village • To promote Ecotourism, Heritage Tourism, Community Based Tourism, Community camping and research and training programme related to wildlife and bird-watching • Enhance the institutional capacity of the community organizations • Dedicated to environmental and biodiversity Conservation of the area • To support Department of Wildlife Conservation in its efforts in wildlife and environmental conservation • Fix sign boards in selected areas along the Weligatta-Kirinda road to educate the motorists as there are instances where many animals are killed by the motorists

In a community camping programmes, visitors could enjoy the nature at its best as they are guided by the community who posesses sound knowledge of the area. In ecotourism, the ecotourists wish to make sure whether the money spend by them supports the community.

Sri Lanka Ecotourism Foundation regularly monitors the camping programme and provides necessary guidelines and training to the community groups. The SLEF identified the following ecotourism activities that could offer the visitors to the Bundala Community Camping site.

Ecotourism activities possible at the Camping Site, Bundala
• Home stay, Camping, Ecolodges/Tree houses accommodation
• Trekking/walking through the village and wildlife nature trails
• Wildlife Safari (by jeeps) and walks in the nature trails
• Bird watching (Avitoruism) • Agro-tourism/organic farming, demonstration on rural farming, animal husbandry and chena (Slash and burn), and open fire cooking • Culture, Heritage and spiritual tourism Visits to cultural festivals, archaeological, historical and religious sites in the area • Study and Research of Human elephant conflict, Biodiversity, birds life, Marine Ecotourism, geo tourism • Indigenous ayurvedic practices, 'Weda Gedara' concept (for wellness tourism) • Turtle watching in situ • Canoeing, boating, rafting in the lagoons to see wildlife and birds • Sea Kayaking
• Cycling in the village tracks • Fishing and angling in sea, lagoons and village tanks using traditional fishing rods • Cross-cultural activities/events • Observation/study of flora and fauna in the surroundings • Promote Tree/Mangrove planting at the Bundala National Park • Conduct regular awareness programmes for school children and other environmentally conscious groups on ecotourism, wildlife. bird-watching, biodiversity conservations in and around Bundala National Park

# 1998 -2009 ශ්‍රී ලංකාවේ පාරිසරික හා ජනහිත කාමී සංචාරක ව්‍යාපාරයේ නව උදාවක් සනිටුහන් කරයි

1998 දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම මේ දක්වා ශ්‍රී ලකාවේ පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම උදෙසා සුවිශාල මෙහෙවරක් ඉටුකර ඇත. පාරිසරික සංචාරක ව්‍යාපාරය පිළිබඳව ශ්‍රී ලංකාවට උචිත ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට පෙරමුණ ගැනීම, නව සකල්ප තුලින් සංචාරක ක්ෂේත්‍රය ජනතාව දැනුවත් කිරීම සංචාරක ක්‍රියාවලින් සක්‍රීය අන්දමින් සිදු කරන්නාවූ ප්‍රදේශවල ජනතාවට සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථික සමාජයීය හා සංස්කෘතිකමය ප්‍රතිලාභ ලබා දීම සඳහා සංචාර ක්ෂේත්‍රය හා ජනතාව දැනුවත් කිරීම හා ඒ පිළිබඳව විවිධ උපාය මාර්ගයන් සැකසීම හා ඒහා බැඳුන පාරිසරික සංචාරක ප්‍රජා මූල ව්‍යවසායයන් පිහිටුවීමට ජනතාව දැනුවත් කිරීම හා එවැනි සංගම් ක්‍රියාත්මක කොට සංචාරක ක්ෂේත්‍රයට හඳුන්වාදීම. සරළව සදහන් කළහොත් ප්‍රජා මූල පාරිසරික සංචාරක ව්‍යවසායයන් ක්‍රියාත්මක කිරීම තුළින් සංචාරක කටයුතු දියුණුව තිබෙන ප්‍රදේශවල ජනතාවගේ දිළිඳු භාවය අවම කළ හැකි බවට මුල්වරට 'හඬක්' නැගුවේත් ඒවා අද තිබෙන තත්වයට නගා සිටුවීමට උපදෙස් හා මගපෙන්වීම ලබාදෙනු ලැබුවෙත් ශ්‍රී ලංකා පාරිසරික ජනහිතකාමී සංචාරක පදනම මගිනි.

දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යාපෘතීන් කීපයක් පහත දක්වේ. මෙ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර හා ජාතික සංවිධාන කීපයක්ම සමග සහයෝගයෙන් කටයුතු කොට ඇත.



- බුන්දල ප්‍රජාමූල පාරිසරික සංචාරක කඳවුරු සංසදය (හම්බන්තොට, ජාත්‍යන්තර කෙයාර් සංවිධානය සමග)
- රන්පත්විල ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යවසාය ( ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා ස්වභාවික සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය හා කුරුණෑගල වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග)
- සදාසෙත්ගම ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යාපෘතිය -දඹුල්ල (ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා ස්වභාවික සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය හා කැකිරාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග)
- ආරුගම්බේ ප්‍රජාමූල පාරිසරික සංචාරක මාර්ගෝපදේශ සංගමය ( ඉතාලියේ අයි.සී.ර්.අයි ජාත්‍යාන්තර සංවිධානය හා සේවාලංකා පදනම සමග)
- සිංහරාජ ලෝක උරුම වැසි වනාන්තර ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යාපෘතිය-ගෘහස්ථ සංචාරක නවාතැන් පහසුකම් හා මාර්ගෝපදේෂ කටයුතු (සේවා ලංකා පදනම සමග)

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ඉතා ප්‍රචලිතව සිදුකෙරෙන්නාවූ ප්‍රදේශවල ක්‍රියාත්මක වන ඉහත සඳහන් ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යාපෘතීන් සඳහා සෘජු ආදායමක් ලබාගැනීම සඳහා ඉතා පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි පාරිසරික සංචාරක වැඩසටහන් සමහරක් ඉහත දැක්වේ

- ප්‍රජාමූල සංගම් මගින් මෙහෙයවනු ලබන - සංචාරක කඳවුරු(Community Camping)
- ගෘහස්ථ සංචාරක නවාතැන් (Home Stays)
- වන සතුන්, කුරුල්ලන්, සමනලයින් හා කැස්බෑවුන් නැරඹීම



- දේශීය වෙදකම යෝගී භාවනා ක්‍රම පිළිබඳව සංචාරකයින් උනන්දු කරවීම
- කාබනික ගොවිතැන කෘෂි කාර්මික කටයුතු පිළිබඳ අධ්‍යනය කිරීම
- කලපුවල, වැව්පද්ධති තුළ, මුහුදේ ඔරුපාරු බෝට්ටු පැදීම (Boating, Cannoing)
- පාපැදි සංචරණය (Bicycle Tours)
- ශ්‍රී ලංකා සංස්කෘතික උරුමයන්, පුරාවිද්‍යා සංරක්ෂිත ස්ථාන නැරඹීම හා ගවේෂණ කටයුතු කිරීමට සංචාරකයන් හා එක්වීම

(තවත් බොහෝ සංචාරක ක්‍රියාකාරකම් ඇත)

ඉතා සුළු මුදලක් ආයෝජනය කිරීමෙන් වැඩි ආදායමක් ප්‍රජාවට ලබා ගැනමට ඉහත සඳහන් පාරිසරික සංචාරක ක්‍රම වේදයන් භාවිතා කළ හැකිය. ඒ සඳහා උපදෙස් නිරීක්ෂණ කටයුතු, මගපෙන්වීම හා මූල්‍ය ආධාර ලබාගැනීමට උපකාර කිරීමට ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිත කාමී සංචාරක පදනම ඇප කැපවී සිටී

සංචාරක ව්‍යාපාරයෙන් ජනතාවට ආර්ථික වාසි සැලසිය හැකි පරිසර සංරක්ෂණයට හා සංස්කෘතික උරුමයන් රැකදීමට අතහිත දිය හැකි ඉහත සඳහන් ආකාරයේ ප්‍රජාමූල පාරිසරික සංචාරක ව්‍යාපෘතියක් ඔබ ප්‍රදේශයේද



ආරම්භ කිරීමට කැමතිනම් ශ්‍රී ලංකා පාරිසරික හා ජනහිතකාමී සංචාරක පදනම අමතන්න

**Office;** 17, Atsumi Holiday Resort, Thuduwa, Madapatha, Sri Lanka **Telephone:** +94 (11) 4920344 Fax; + (94 11) 2706433 **Mobile;** + (94 777) 631334 Email: sleco@sltnet.lk **Web site:** www ecotourismsrilanka.net www.ecotourssrilanka.com www.ecotourslk.com

JUST IMAGINE WHAT A RANGE OF ACTIVITIES THE COMMUNITY COULD OFFER FOR A DISCERNING ECOTOURIST THROUGH SIMPLE COMMUNITY CAMPING. THE TOURISM AUTHORITIES COULD EASILY PROMOTE THIS SORT OF COMMUNITY CAMPING IN ALL PARTS OF SRI LANKA. COMMUNITY CAMPING PACKAGES ARE VERY AFFORDABLE AND REASONABLE FOR THE VISITOR WHEN COMPARE TO TRADITIONAL CAMPING PACAKAGES OPERATED BY MAIN STREAM TOUR OPERATORS. THE MOST IMPORTANT FACT IS THE TOTAL INCOME OF THE COMMUNITY CAMPING GOES DIRECTLY TO THE COMMUNITY WELFARE